කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

LSA/26/05/09/01

වර්ණය: **කහ**

ඉදිරි කාලගුණය පිළිබඳව විශේෂ නිවේදනය.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ස්වභාවික විපත් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2026 මැයි මස 09 දින ප.ව. 06.30 ට නිකුත් කරන ලදී.

සැලකිලිමත් වන්න!

ශ්‍රී ලංකාව ආශ්‍රිතව පවතින පහළ වායුගෝලීය කැළඹිලි ස්වභාවය, මැයි මස 11 දින පමණ වනවිට අඩු පීඩන කලාපයක් දක්වා වර්ධනය විය හැක. මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන්, දිවයිනේ දැනට පවතින වැසි තත්ත්වය ඉදිරි දින කිහිපයේදී තවදුරටත් බලාපොරොත්තුවේ.

මෙම පද්ධතියේ වර්ධනය හේතුවෙන් ඉදිරිදිනවලදී දිවයින වටාවන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවලත්, බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශවලත් තද සුළං ඇතිවිය හැකි අතර මුහුදු ප්‍රදේශ රළු වීමේ හැකියාවක් පවතී.

අද(09) දින දත්ත මත පදනම්ව ඉදිරි පැය 168 තුළ පීඩන අවපාතයක් දක්වා වර්ධනය වීමේ සම්භාවිතාව

ඉදිරි පැය 24	ඉදිරි පැය 24-48	ඉදිරි පැය 48-72	ඉදිරි පැය 72-96	ඉදිරි පැය 96-120	ඉදිරි පැය 120-144	ඉදිරි පැය 144-168
නැත	නැත	නැත	නැත	අඩු	සාමාන්‍ය	ඉහළ

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාව ඇතුළු මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.
දු. ක: 0112 686 686 (පැය 24 ක්‍රියාත්මකයි)